

**පළවෙනි සභාපතිත්වයේ පළවෙනි උපදේශකවරයා**
*සභාපති හෙන්රි බී. අයිරින්*

# සභාපති හෙන්රි බී. අයිරින් විසිනි

සේවය කිරීමේ කැඳවීම්වලදී, ජනතාව ස්ථිරකිරීමට සහා සාමාජිකයන් වශයෙන් අපට නිතර කැඳ-වීම් ලැබේ. වසර ගණනාවකට පෙර 18 හැවිරිදි ශිෂ්‍යයෙක් ස්වාමීන්වහන්සේගේ සේවකයන් ස්ථිරකිරීමේ අදහස කුමක්දැයි මට පෙන්වීය. එම යටහත් පහත් ආදර්-ශය මගින් මම තාමත් ආශිර්වාදිතව සිටිමි.

ඔහු විද්‍යාලයේ පළමු වසර ආරම්භ කළා පමණි. ඔහුව බව්තීස්මකරන ලද්දේ, විශාල විශ්ව විද්‍යාලයක සිය අධ්‍යයනය ආරම්භකිරීමට නිවසින් පිටවීමට වසරකට පමණ පෙරය. මම එහි සභානායක ලෙස සේවය කළෙමි.

පාසල් වසර ආරම්භවූ විට, සභානායක කාර්යාලයේදී ඔහු සමග මම කෙටි සාකච්ඡාවක් පැවැත්වූවෙමි. එම පළමු සකාච්ඡාවේදී අළුත් ස්ථානයේ ඔහු කථා කල ඔහුට තිබූ අභියෝග හැර, මට මතක ඉතා මඳ ප්‍රමාණයකි. නමුත්, අපේ දෙවන සාකච්ඡාව මට කිසිදා අමතක නොවේ.

13 මගේ කාර්යාලයේදී මා හමුවීමට හැකිදැයි ඔහු ඇසීය, මා පුදුමයට පත්කරමින් ඔහු මෙසේ කීවේය, "අප එකට යාච්ඤාකිරීමටත් මට එය ඉදිරිපත්කිරීමටත් හැකිද?" මා දැනටමත් යාච්ඤාකර ඇති බවත්, ඔහුද එසේ කර ඇති බව මම සිතන බවත් කීමට සිතුනද, මම එකඟවීමි.

ඔහු සිය යාච්ඤාව පටන්ගත්තේ සාක්ෂියකිනි, සභානායකවරයා කැඳවා තිබෙන්නේ දෙවියන්වහන්සේ විසින් බව ඔහු දන්නා බව ඔහු කීවේය. විශාල ආත්මික සිද්ධියකදී ඔහු කල යුතු දේ මට කීමට ඔහු දෙවියන්වහන්සේගෙන් ඉල්ලීය. තරුණ මිනිසා දෙවියන්ව-හන්සේ අමතා, සභානායකවරයා ඔහුගේ අවශ්‍යතාවයන් දැනටමත් දන්නා බව ඔහුට ස්ථිර බවත්, ඔහුට ඇසීමට අවශ්‍ය උපදෙස් දෙනු ඇති බවත් කීවේය.

ඔහු කථාකරන විට, ඔහුට මුහුණදීමට සිදුවන යම් අනතුරක් මගේ සිතට ආවේය. උපදේශය සරල වුවත්, විශාල ලෙස පැහැදිලිව දෙන ලදීඃ නිතරම යාච්ඤාක-රන්න, පණත්වලට කීකරුවන්න, බිය නොවන්න.

සභාවේ වසරක කාලයක් ගෙවා තිබෙන ඒ තරුණ මිනිසා, ආදර්ශයෙන් ඉගැන්වූයේ, නායකයෙක් ඔහු සේව-යකිරීමට කැඳවූ අයගේ ඇදහිල්ලෙන් සහ යාච්ඤාවෙන් ස්ථිරකළවිට, දෙවියන්වහන්සේට ඔහු තුලින් කළ හැකි දෙයයි. සභාවේ පොදු කැමැත්ත පිළිබඳ නීතිය එම තරුණ මිනිසා මට ප්‍රදර්ශනය කළේය (බලන්න ඩීසහසී 26:2). දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සේවකයන් එළිද-රව් තුලින් කැඳවූවද, ඔවුන්ට ක්‍රියාකිරීමට හැක්කේ ඔවුන් සේවයකිරීමට කැඳවූ අය විසින් ස්ථිරකිරීමෙන් පසුව පම-ණකි.

අපගේ ස්ථිරකිරීමේ ඡන්දයෙන්, අපි ගරුගම්භීර පොරොන්දු තබන්නෙමු. ස්වාමීන්වහන්සේගේ සේවකයන් වෙනුවෙන් යාච්ඤාකිරීමට අප පොරොන්දුවන අතර, ඔහු

ඔවුන්ට මගපෙන්වමින්, ඔවුන්ව ශක්තිමත්කරනු ලැබේ (බලන්න ඩීසහගී 93:51). ඔවුන්ගේ කැඳවීම් අනුව ඔවුන් ක්‍රියාකරන විට, ඔවුන්ගේ උපදෙස් තුලින් දේව පෙළඹවීම් සොයමින් එය අත්විඳීමට අප බලාපොරොත්තුවන බවට අපි ප්‍රතිඥා දෙන්නෙමු (බලන්න ඩීසහගී 1:38).

එම පොරොන්දුව අපි නිතරම අපගේ හදවත් තුලින් අළුත්කළ යුතුය. ඔබගේ ඉරුදින පාසල් ගුරුතුමිය ආත්ම-යාණන් මගින් ඉගැන්වීමට උත්සාහ කළද, ඔබ අතින්ද සිදුවිය හැකි පරිදි, ඔබගේ ගුරුතුමියටද පංතිය ඉදිරිපිට වැරදීමට ඉඩ තිබේ. කෙසේ වුවද, දේව පෙළඹවීම්වලට ඇහුම්කන්දී, ඒවා එන වෙලාවල් ගැන පරීක්ෂාවෙන් සිටී-මට තීරණයකිරීමට ඔබට හැකිය. වැරදි ඉතා ස්වල්පයක් සහ බොහෝ සාක්ෂිද සහිතව දෙවියන්වහන්සේ එම ගුරුවරිය ස්ථිරකරන බව නියම වෙලාවට දැකගැනීමට ඔබට හැකිය.

අපි පුද්ගලයෙක්ව ස්ථිරකිරීමට අත ඔසවන විට, එම පුද්ගලයාගේ කැඳවීම තුලින් ස්වාමීන් වහන්සේගේ අර-මුණ ඉටුකරගැනීමට වැඩකිරීමට අපි පොරොන්දුවන්නෙමු. අපගේ ලමුන් කුඩා කාලයේදී, අපගේ කොට්ඨාශයේ කුඩා ලමුන්ට ඉගැන්වීමට මගේ බිරිඳට කැඳවීමක් ලැබුනි. මගේ අත මම එසවූයේ ඇයව ස්ථිරකිරීමට පමණක්ම නොව, මම ඇය වෙනුවෙන් යාච්ඤාකර, ඇයට උපකාරකිරීමට අවසරද ඉල්ලුවෙමි.

සිය සභානායකවරයා වසර ගණනාවකට පෙර ස්ථිර-කළ එම තරුණ මිනිසා සමග මම කථා කළෙමි, ස්වා-මීන්වහන්සේ සහ ජනතාව ධර්මදූතයෙක් ලෙස, ස්ටේක් සභාපතිවරයෙක් සහ පියෙක් ලෙස ඔහුගේ කැඳවීම ස්ථිරකර ඇති බව මම දැනගත්තෙමි. අපගේ සාකච්ඡාව නිමවූ පසුව ඔහු මෙසේ කීවේය. "මම හැම දිනකම තව-මත් ඔබ වෙනුවෙන් යාච්ඤා කරමි."

අපට සේවයකිරීම සඳහා දෙවියන්වහන්සේ කැඳවූ යමෙක් වෙනුවෙන් යාච්ඤාකිරීමට අපට අධිෂ්ඨානකළ හැකිය. සිය සේවය තුලින් අපට ආශිර්වාදකළ යෙමෙකුට ස්තුතිකිරීමට අපට හැකිය. අප ස්ථිරකළ යමෙක් ස්වේච්-ඡාව සඳහා ඉල්ලූ විට, ඉදිරියට යාමට තීරණයකිරීමට අපට හැකිය.[1]

ස්වාමීන්වහන්සේගේ සේවකයන්ව උන්වහන්සේගේ රාජ්‍යය තුල නගා සිටුවන අය, ස්ථිරකරනු ලබන්නේ උන්වහන්සේගේ අසමාන බලයෙනි. අප සියල්ලන්ටම එම ආශිර්වාදය අවශ්‍යවේ.

**සටහන**

1. බලන්න *Teachings of Presidents of the Church: Joseph F. Smith* (1998), 211–12.

**මෙම පණිවුඩයෙන් ඉගැන්වීම**

මෙම පණිවුඩය බෙදාගැනීමෙන් පසුව, පහත සඳහන් උපුටාගැනීම කියවීම ගැන සලකාබලන්නː "ඔබ යටහත් පහත්, ඇදහිලිමත් සහ උද්‍යෝගීමත් නම්, ඔබව ස්වාමීන්ව-හන්සේ උන්වහන්සේගේ හස්තයේ මෙවලමක් කරනසේක. . . . සභාව විසින් ඔබව ස්ථිරකරන විට, ඔබට තවත් ශක්තිය ලැබෙනු ඇත" (*Teaching, No Greater Call* [1999], 20). යම්කිසි බර දෙයක් වටා පවුලට එකතුවීමට සලස්වා එය එසවීමට උත්සාහකරන ලෙස එක් කෙනෙකුට කියන්න. වරකට එක් අයෙකු බැගින් එකතුවී එය එසවීමට පවුල් සාමාජිකයන්ට කියන්න. හැම කෙනෙක්ම උදව්කරන විට සිදුවන දේ සාකච්ඡාකරන්න. කැඳවීම් වලදී අන් අයව අපට ස්ථිරකළ හැකි ප්‍රායෝගික මාර්ග ගැන සභාපති අයිරින්ගේ උපදෙස් අවධාරණයකිරීම ගැන සලකා බලන්න.

## තරුණ අය

### මගේ ඉරුදින පාසල් ගුරුවරියට ස්තුතියි

**නම සඳහන් නොවේ**

මගේ ඉරුදින පාසල් පංතිය නිතරම ගෞරවනීය නොවේ, හැම සතියකම පාඩමට සවන්දීමට මම කැමති නමුත්, මගේ පංතියේ අන් අය එසේ නොවන බව සමහර අවස්ථාවලදී පෙනීමට තිබුනි. අපගේ ගුරුතුමිය අපට උගන්වන අතර, ඔවුහු නිතරම අන් අය හා කථාකිරීම හෝ විද්‍යුත් මෙවලම් සමග ක්‍රීඩාකිරීම හෝ කරති, සමහර අවස්ථාවලදී මාද එම ප්‍රශ්නයේ කොටස්-කරුවෙකු වීම කණගාටුවකි.

එක් සතියක් අපි සාමාන්‍ය තත්වයට වඩා නරක්වූ අතර, පංතිය අවසාන-යේදී, අපේ ගුරුතුමියට හැඬුම් ආවේ කිසිවෙක් ඇගේ පාඩමට සවන් නොදුන් නිසාය අපි පංතිකාමරයෙන් පිටව යන විට, මට වරදකරු බවක් හැඟින.

ඊළඟ ඉරුදින අපගේ ගුරුතුමිය පැහැදිළිකරමින්, ඇය එම සතියේ මග-පෙන්වීම් සොයමින්, බොහෝසේ යාච්ඤාකළ බවත්, අපට සභා චිත්‍රපටයක් පෙන්වීමට ඇයට සිතුන බවත් කීවාය. ඇය චිත්‍රපටය ආරම්භ කළාය. එය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය සහ උන්වහන්සේ කළ ආශ්චර්යයන් ගැන චිත්‍රපටයකි.

එම සැන්දෑවේ මා එම චිත්‍රපටය ගැන කල්පනාකරන විට, මට යම් වෙන-සක් හැඟින. වෙනත් කිසිදාකටත් වඩා වැඩියෙන් මට ආත්මයාණන් හැඟෙන බව හදිසියේම මට අවබෝධවිය. ගැලවුම්කරුවාණන් මෙන් වීමට මගේ ජීවිතය වෙනස්කිරීමට මම එකෙණෙහිම තීරණයකළ අතර, ඒදින ඉරුදින පාසලේ අත්දැකීම්වලින් මගේ සාක්ෂිය විශාල ලෙස ශක්තිමත්වූ බවද මට අව-බෝධවිය. මගේ ඉරුදින පසල් ගුරුතුමිය ගැන හා සෑම සතියකම අපේ පංතිය වෙනුවෙන් ඇය කරන දේවල් වෙනුවෙන්ද මම බොහෝ ස්තුතිවන්ත වෙමි.

© 2012 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණ-යකරන ලදී, ඉංග්‍රීසි අනුමැතියː 6/11, පරිවර්තන අනුමැතියː 6/11. *First Presidency Message, June 2012* පරිවර්තනයයි. Sinhala. 10366 408

# බැහැදැක ඉගැන්වීම, පූජනීය පැවරුමකි

ඇදහිල්ල, පවුල, සහනය

*මෙම ලිපිය යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකර, අදාළ ලෙස, ඔබ බැහැදකින සොහොයුරියන් හා එය බෙදාගන්න. ඔබගේ සොහොයුරියන්ව ශක්තිමත්කරන සහ සහන සමිතිය ඔබගේ ජීවිතයේ ක්‍රියාකාරී කොටසක් කිරීමට ඔබට උපකාරවත් වන ප්‍රශ්න අසන්න.*

බැහැදැක උගන්වන ගුරුවරියන් ලෙස, අපට ඉටුකිරීමට වැදගත් ආත්මික කැඳවීමක් ඇත. "කොට්ඨාශයේ පත් කළ එඬේරා වන, සභානායකවරයාට, ස්වාමීන්වහන්සේගේ සියලුම බැටළුවන් එක් වර බැලිය නොහැකිය. ඔහු බැහැදැක උගන්වන ආනුභාමත් ගුරුවරියන්ගේ උපකාරය බලාපොරොත්තු වෙයි."[1] එක් එක් සොහොයුරිය බලාගැනීමට පැවරිය යුතු අය එළිදරව්වෙන් සොයා දැනගැනීම අත්‍යාවශ්‍යවේ.

පෙළඹවීම ආරම්භවන්නේ සහන සමිති සභාපතිත්වයේ සාමාජිකාවන් පුද්ගලයන් සහ පවුල්වල අවශ්‍යතාවයන් ගැන යාච්ඤාවෙන් යුතුව සාකච්ඡා කරන විටදීය. ඉන්පසුව, සභානායකවරයාගේ අනුමැතිය ඇතිව, සහන සමිති සභාපතිත්වය දෙන පැවරුම අනුව බැහැදැක ඉගැන්වීම් වැදගත්, ආත්මික වගකීමක් බව වටහාගැනීමට සොහොයුරියන්ට උපකාරවත්වනු ඇත.[2]

බැහැදැක උගන්වන ගුරුවරියෝ අවංකවම එක් එක් සොහොයුරිය ගැන දැනගෙන, ඔවුන්ට ප්‍රේමකරන අතර, ඔවුන්ගේ ඇදහිල්ල ශක්තිමත්කරගැනීමට උදව්කරමින්, අවශ්‍ය විට සේවය ලබාදෙති. ඔවුන් බැහැදකින එක් එක් සොහායුරියගේ ලෞකික සහ ආත්මික අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දක්වන අන්දම ගැන දැනගැනීමට ඔවුහු පුද්ගලික පෙළඹවීම් සොයති.[3]

"බැහැදැක ඉගැන්වීම් ස්වාමීන්වහන්සේ කටයුත්තක් බවට පත්වන්නේ, අප ජනතාව ගැන මිස ප්‍රතිශතය ගැන යොමු නොවන විටය. සත්‍යලෙස, බැහැදැක ඉගැන්වීම් කිසිදා නිම නොවේ, එය බොහෝ විට වැඩකට වඩා ජීවන මාර්ගයකි."[4]

### *ශුද්ධ ලියවිලි වලින්*

මතෙව් 22:36–40; යොහාන් 13:34–35; ඇල්මා 37:6–7

### *අපේ ඉතිහාසයෙන්*

එලිසා ආර්, ස්නෝ, සහන සමිතියේ දෙවන ප්‍රධාන සභාපතිනිය මෙසේ ඉගැන්වූවාය. "ගුරුවරියකගේ තනතුර උසස් සහ ශුද්ධවූ තනතුරක් ලෙස මම සලකමි." ඇය බැහැදැක උගන්වන ගුරුවරියන්ට උපදෙස් දෙමින් "නිවාස බැහැදැකීමට පෙර, දෙවියන්වහන්සේගේ ආත්මයෙන්, ප්‍රඥාවෙන්, නිහතමානීත්වයෙන්, ප්‍රේමයෙන් පිරී සිටින ලෙස කීවාය," එවිට ආත්මික අවශ්‍යතාවයන් සහ ලෞකික අවශ්‍යතාවයන් නිශ්චිතව දැනගැනීමට ඔවුන්ට හැකිවන්නේය. ඇය මෙසේද කීවාය, "සමාදානයේ සහ සහනදායි වචන කථාකිරීමට ඔබට සිතෙනු ඇත, යම් සොහොයුරියක් ශීතලෙන් සිටින බව ඔබ දුටුවහොත්, දරුවෙක් ඔබගේ පපුව ලඟට ගන්නා ලෙස [ඇයව] ඔබගේ පපුවට ලංකරගන්න."[5]

මුල් කාලීන සොහොයුරියන් කලාක් මෙන්, අපද ඇදහිල්ලෙන් ඉදිරියට යන විට, අපට ශුද්ධාත්මයාණන් වහන්සේ ලැබී, අප බැහැදකින එක් එක් සොහොයුරියට උදව්කරන අන්දම ගැන දැනගැනීමට පෙළඹවීම්ද අපට ලැබෙනු ඇත. "බලය වෙනුවට අපි ප්‍රඥාව සොයමු" යයි ස්නෝ සොයුරිය කීවාය, "තවද [අප0] සතු ප්‍රඥාව ක්‍රියාත්මක කිරීමට [අපට] හැකි හැම බලයත්ම [අපට] ලැබෙනු ඇත."[6]

**සටහන්**

1. ජුලී බී. බෙක්, "Relief Society: A Sacred Work," *Liahona,* නොවැ. 2009, 114.
2. බලන්න *Handbook 2: Administering the Church* (2010), 9.5; 9.5.2.
3. බලන්න *Handbook 2,* 9.5.1.
4. ජුලී බී. බෙක්, *Liahona,* නොවැ. 2009, 114.
5. එලිසා ආර්. ස්නෝ, *Daughters in My Kingdom* තුලිනි: *The History and Work of Relief Society* (2011), 108.
6. එලිසා ආර්. ස්නෝ, *Daughters in My Kingdom* තුලිනි, 45–46.

### *මට කළ හැකි දේවල් මොනවාද?*

**1.** බැහැදැක උගන්වන ගුරුවරියක ලෙස මගේ වැදගත් වගකීම් ඉටුකිරීමට මා සතු හැකියාවන් මා දියුණුකරගන්නේ කෙසේද?

**2.** බැහැදැක උගන්වන ගුරුවරියක ලෙස, වෙනත් බැහැදකින ගුරුවරියන්ට ඔවුන්ගේ වගකීම් ඉටුකිරීමට මා උපකාරකරන්නේ කෙසේද?

වැඩිදුර තොරතුර සඳහා යන්න, reliefsociety.lds.org.

© 2012 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී, ඉංග්‍රීසි අනුමැතිය: 6/11. පරිවර්තන අනුමැතිය: 6/11. June 2012 Visiting Teaching Message, පරිවර්තනයයි. Sinhala. 10366 408